# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2021 ඔක්තෝබර් මස 08 වන දින

## II වන කොටස

## අතිරේකය

(2021.10.08 දින නිකුත් කරන ලදී)

## අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන)

**1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

අධිකරණ අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 24.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## නීතිය බලපෑමේ ප්‍රකාශය

***2 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතට 144අ අලුත් වගන්තිය ඇතුළත් කිරීමෙන් ඒ පනත සංශෝධනය කරනු ලබන අතර, සංශෝධනයේ නීතිය බලපෑම වනුයේ ඒ වගන්තියේ නිශ්චිතව දක්වා ඇති අවස්ථානුගත කරුණු යටතේ යම් සැකකරුවකුට හෝ චූදිතයකුට අධිකරණයේ පෞද්ගලිකව ම පෙනී සිටින ලෙස නියම කිරීම අත්හැරීම සඳහා මහෙස්ත්‍රාත්වරයාට බලය ලබා දීමට විධිවිධාන සැලැස්වීම වේ.

***3 වන වගන්තිය :***මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 241 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එය 4 වන වගන්තිය මගින් සිදු කරනු ලබන සංශෝධනයට ආනුෂංගික වේ.

***4 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 241අ අලුත් වගන්තිය ඇතුළත් කිරීමෙන් එම ප්‍රඥප්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධනයේ නීතිය බලපෑම වනුයේ ඒ වගන්තියේ නිශ්චිතව දක්වා ඇති අවස්ථානුගත කරුණු යටතේ යම් චූදිතයකුට අධිකරණයේ පෞද්ගලිකව ම පෙනී සිටින ලෙස නියම කිරීම අත්හැරීම සඳහා මහාධිකරණ විනිශ්චයකාරවරයාට බලය ලබා දීමට විධිවිධාන සැලැස්වීම වේ.

# අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන)

එල්.ඩී.-ඕ 5/2018

## 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

**1.** මේ පනත 2021 අංක    දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1979 අංක 15 දරන පනතට 144අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 144 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම පනතේ 144අ වන වගන්තිය ලෙස බලාත්මක විය යුතු යː-

"විශේෂ අවස්ථානුගත කරුණු යටතේ සැකකරුට හෝ චූදිතයාට පෞද්ගලිකවම පෙනී සිටින ලෙස නියම කිරීම අත්හැරිය හැකි බව

144අ. (1) මහෙස්ත්‍රාත්වරයා ඉදිරියේ අපරාධ නඩුවක් පවරනු ලැබ ඇත්තේ කවර සැකකරුවකු හෝ චූදිතයකු සම්බන්ධයෙන් ද, එම සැකකරු හෝ චූදිතයා රඳවා තබා ගැනීමේ කාලසීමාව දීර්ඝ කිරීම සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සඳහා එම සැකකරුට හෝ චූදිතයාට අධිකරණයේ පෞද්ගලිකව ම පෙනී සිටින ලෙස නියම කිරීම, මහෙස්ත්‍රාත්වරයා විසින් (4) වන උපවගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගෙන, අත්හරිනු ලැබිය හැකි ය.

(2) (4) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති හේතු එකක් හෝ වැඩි ප්‍රමාණයක් මත, යම් සැකකරුවකු හෝ චූදිතයකු අධිකරණයේ පෞද්ගලිකව ම පෙනී සිටීමට නියම කිරීම අත්හරිනු ලැබිය හැකි බවට මහෙස්ත්‍රාත්වරයා සෑහීමකට පත් වන්නේ නම්, (3) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති අදාළ තැනැත්තා විසින් සිදු කරනු ලබන ඉල්ලීමක් මත, එම සැකකරුට හෝ චූදිතයාට පෞද්ගලිකව ම පෙනී සිටීමට නියම කිරීම එසේ අත්හරිනු ලැබිය හැකි ය.

(3) සැකකරුවකු හෝ චූදිතයකු සම්බන්ධයෙන්, (2) වන උපවගන්තිය යටතේ වන යම් ඉල්ලීමක්-

(අ) නීතිපතිවරයා විසින්;

(ආ) අවස්ථාවෝචිත පරිදි, සැකකරු හෝ චූදිතයා විසින් ම හෝ ඔහුගේ නීතීඥවරයා විසින්;

(ඇ) අදාළ පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා විසින්; හෝ

(ඈ) සැකකරු හෝ චූදිතයා රඳවා ඇති බන්ධනාගාරයේ බන්ධනාගාර අධිකාරිවරයා විසින්,

කරනු ලැබිය යුතු ය.

(4) මහෙස්ත්‍රාත්වරයා විසින් (1) වන උපවගන්තිය යටතේ සැකකරුට හෝ චූදිතයාට පෞද්ගලිකව ම පෙනී සිටින ලෙස නියම කිරීම අත්හැරීම, පහත දැක්වෙන හේතු මත සිදු කරනු ලැබිය හැකි යː-

(අ) සැකකරුගේ හෝ චූදිතයාගේ ජීවිතයට තර්ජනයක් හෝ බරපතල හානියක් පිළිබඳ සැකයක් පවතින අවස්ථාවක දී;

(ආ) සැකකරු හෝ චූදිතයා විසින් සිදු කරන ලදැයි කියනු ලබන වරදට මහජනතාව දක්වන ප්‍රතික්‍රියාව මගින් සාමය කඩවීමක් සිදු වීමට ඉඩ ඇති අවස්ථාවක දී;

(ඇ) සැකකරු හෝ චූදිතයා රඳවා තබා ගැනීමෙන් මිදී පලා යාමට හෝ ස්වේච්ඡාවෙන් නොවන ආකාරයට රඳවා තබා ගැනීමෙන් ඉවත් කරනු ලැබීමට ඉඩ ඇති අවස්ථාවක දී;

(ඈ) සැකකරු හෝ චූදිතයා අධිකරණයේ නඩු කටයුතුවලට බාධා කිරීමට ඉඩ ඇති අවස්ථාවක දී;

(ඉ) ජීවිතයට අන්තරායදායක වන යම් බෝවන හෝ සංස්පර්ශක රෝගයක් පැතිරීම වැළැක්වීම පිණිස සැකකරු හෝ චූදිතයා යම් ලිඛිත නීතියක් යටතේ නිරෝධායන තත්ත්වයකට ලක් කරනු ලැබ ඇති අවස්ථාවක දී;

(ඊ) යම් ලිඛිත නීතියක විධිවිධාන ප්‍රකාරව අනිවාර්ය පුනරුත්ථාපනයට ඇතුළත් කර ඇති සැකකරුවකුගේ හෝ චූදිතයකුගේ පෞද්ගලිකව ම පෙනී සිටීම එම සැකකරුගේ හෝ චූදිතයාගේ පුනරුත්ථාපන ක්‍රියාවලියට බාධාවක් වන අවස්ථාවක දී සහ එම පෙනී සිටීම රඳවා තැබීමේ කාලසීමාව දීර්ඝ කිරීමේ කාර්යය සඳහා වන අවස්ථාවක දී; හෝ

(උ) තත්කාලයේ පවතින යම් වසංගත රෝග තත්ත්වයක් හෝ වෙනත් ඒ හා සමාන තත්ත්වයක් හේතුවෙන් සැකකරු හෝ චූදිතයා පෞද්ගලිකව ම පෙනී සිටීම මගින් මහජනතාවගේ ආරක්ෂාවට සහ සෞඛ්‍යයට තර්ජනයක් ඇති වීමට ඉඩ ඇති අවස්ථාවක දී:

එසේ වුව ද, (4) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති හේතුවක පැවැත්ම නතර වී ඇති බව මහෙස්ත්‍රාත්වරයාගේ මතය වන අවස්ථාවක ඔහු විසින් සැකකරුට හෝ චූදිතයාට අධිකරණයේ පෞද්ගලිකව ම පෙනී සිටිය යුතු යැයි විධාන කළ හැකි අතර, ඔහුගේ පෙනී සිටීම මෙහි මින් පෙර විධිවිධාන සලස්වා ඇති ආකාරයෙන් බලාත්මක කරනු ලැබිය යුතු ය.

(5) මහෙස්ත්‍රාත්වරයා විසින්, (1) වන උපවගන්තිය යටතේ සැකකරුවකුට හෝ චූදිතයකුට අධිකරණයේ පෞද්ගලිකව ම පෙනී සිටීමට නියම කිරීම අත්හරින අවස්ථාවක දී, ඒ සඳහා වන හේතු ලිඛිතව වාර්තා කරනු ලැබිය යුතු අතර, එම සැකකරුට හෝ චූදිතයාට-

(අ) නීතිඥවරයකු මගින් අධිකරණයේ දී තමා නියෝජනය කරනු ලැබීමට අයිතිය තිබිය යුතු ය; සහ

(ආ) සමකාලීන හෝ ආසන්න සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් හරහා ඔහුගේ නියෝජනය සිදු කිරීමට සහ ඒ සැකකරු හෝ චූදිතයා විසින් හෝ ඔහු වෙනුවෙන් හෝ ඔහු සම්බන්ධයෙන් පවරනු ලැබ ඇති නඩු කටයුතු එවැනි සම්බන්ධකයක් මගින් නිරීක්ෂණය කිරීමට අවසර දෙනු ලැබිය යුතු ය.

(6) (අ) මහෙස්ත්‍රාත් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින්, (5) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව සැකකරුට හෝ චූදිතයාට ඔහුගේ නියෝජනය සිදු කිරීම සඳහා සහ නඩු කටයුතු නිරීක්ෂණය කිරීම සඳහා පහසුකම් සැළසීමට අධිකරණය තුළ අවශ්‍ය කටයුතු පිළියෙළ කරනු ලැබිය යුතු ය.

(ආ) සැකකරු හෝ චූදිතයා රඳවා තබා ඇති බන්ධනාගාරයේ අධිකාරිවරයා හෝ එම සැකකරු හෝ චූදිතයා රඳවා තබා ඇති ස්ථානය භාර නිලධරයා විසින්, මහෙස්ත්‍රාත් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විමසා, (අ) ඡේදයේ සඳහන් කර ඇති පරිදි ඔහුගේ නියෝජනය සිදු කිරීම සඳහා සහ අධිකරණයේ නඩු කටයුතු නිරීක්ෂණය කිරීම සඳහා රඳවා තබාගන්නා ලද සැකකරුට හෝ චූදිතයාට අවශ්‍ය පහසුකම් සලස්වනු ලැබිය යුතු ය.

(ඇ) මේ උපවගන්තියේ කාර්යය සඳහා "රඳවා තබා ඇති ස්ථානය" යන්නෙන් යම් ලිඛිත නීතියක අර්ථානුකූලව යම් රඳවා තැබීමේ පහසුකමක් අදහස් වන අතර, (222 වන අධිකාරය වූ) නිරෝධායන සහ රෝග වැළැක්වීමේ ආඥාපනතේ අර්ථානුකූලව යම් නිරෝධායන මධ්‍යස්ථානයක් සහ 2007 අංක 54 දරන ඖෂධවලට ඇබ්බැහි තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්ථාපනය) පිළිබඳ පනතේ අර්ථානුකූලව යම් ප්‍රතිකාර හා පුනරුත්ථාන මධ්‍යස්ථානයක් ද ඊට ඇතුළත් වේ.

(7) එවැනි සැකකරුවකු හෝ චූදිතයකු රඳවා තබා ඇති ස්ථානය, එම සැකකරුට හෝ චූදිතයාට අධිකරණයේ පෞද්ගලිකව ම පෙනී සිටීමට නියම කිරීම අත්හරින ලද මහෙස්ත්‍රාත්වරයාගේ අධිකරණ කොට්ඨාසය තුළ පිහිටන්නා වූ අවස්ථාවක දී, නඩුව කැඳවීමෙන් පසු පැය හතළිස් අටක් ගතවීමට පෙර එම මහෙස්ත්‍රාත්වරයා විසින් එම රඳවා තබා ඇති ස්ථානය බැලීමට යා යුතු අතර, එසේ රඳවා තබන සැකකරුගේ හෝ චූදිතයාගේ යහසාධනය පිළිබඳ සොයා බැලිය යුතු ය.

(8) සැකකරු හෝ චූදිතයා රඳවා තබා ඇති ස්ථානය, එම සැකකරුට හෝ චූදිතයාට අධිකරණයේ පෞද්ගලිකව ම පෙනී සිටීමට නියම කිරීම අත්හරින ලද මහෙස්ත්‍රාත්වරයාගේ අධිකරණ කොට්ඨාසයෙන් පිටත පිහිටන්නා වූ අවස්ථාවක දී, (7) වන උපවගන්තියේ සඳහන් කර ඇති කාර්යය සඳහා සැකකරු හෝ චූදිතයා රඳවා තබා ඇති ස්ථානය බැලීමට යන ලෙස අදාළ අධිකරණ කොට්ඨාසය විෂයයෙහි අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයාට නියමිත ආකෘති පත්‍රය මගින් වහාම දැනුම් දීම එම මහෙස්ත්‍රාත්වරයාගේ කාර්යය විය යුතු ය.

(9) සැකකරු හෝ චූදිතයා රඳවා තබා ඇති ස්ථානය පිහිටා ඇත්තේ කවර මහෙස්ත්‍රාත්වරයකුට අයත් අධිකරණ කොට්ඨාසය තුළ ද, එම මහෙස්ත්‍රාත්වරයාට රඳවා තබා ඇති ස්ථානය බැලීම සඳහා යාමට හැකියාවක් නොමැති අවස්ථාවක දී, (7) වන උපවගන්තියේ සඳහන් කාර්යය සඳහා සැකකරු හෝ චූදිතයා රඳවා තබා ඇති ස්ථානය බැලීමට යන ලෙස නියමිත ආකෘති පත්‍රය මගින් වෙනත් යම් මහෙස්ත්‍රාත්වරයකුට වහාම දැනුම් දීම එම මහෙස්ත්‍රාත්වරයාගේ කාර්යය විය යුතු ය.

(10) (8) වන හෝ (9) වන උපවගන්තිය යටතේ දැනුම් දීමක් කරනු ලැබුවේ යම් මහෙස්ත්‍රාත්වරයකුට ද, ඒ මහෙස්ත්‍රාත්වරයා විසින් එම සැකකරු හෝ චූදිතයා රඳවා තබා ඇති ස්ථානය බැලීමට යන ලෙස ඉල්ලා සිටින ආකෘති පත්‍රය ඔහුට

ලැබීමෙන් පැය හතළිස් අටක් ගතවීමට පෙර එම ස්ථානය බැලීමට යා යුතු අතර, එසේ බැලීමට යාමෙන් සතියක් ඇතුළත සැකකරුට හෝ චූදිතයාට පෞද්ගලිකව ම පෙනී සිටීමට නියම කිරීම අත්හරින ලද මහෙස්ත්‍රාත්වරයා වෙත එසේ බැලීමට යාම පිළිබඳව, තත් කාර්යය සඳහා නියමිත ආකෘති පත්‍රයෙන් ලිඛිතව වාර්තා කරනු ලැබිය යුතු ය.

(11) එසේ රඳවා තබා සිටින එවැනි යම් සැකකරුවකු හෝ චූදිතයකු, (7) වන, (8) වන හෝ (9) වන උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව බන්ධනාගාරයට පැමිණෙන මහෙස්ත්‍රාත්වරයකු වෙත ඉදිරිපත් කිරීම සහ එම මහෙස්ත්‍රාත්වරයා විසින් නියම කරනු ලබන පහසුකම් සැලැස්වීම බන්ධනාගාර අධිකාරිවරයාගේ කාර්යය විය යුතු ය.

(12) යම් මහෙස්ත්‍රාත්වරයකු විසින්, (7) වන, (8) වන හෝ (9) වන උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව යම් සැකකරුවකුගේ හෝ චූදිතයකුගේ යහසාධනය පිළිබඳ සොයා බැලීමට යම් බන්ධනාගාරයක් වෙත යන අවස්ථාවක දී, එම සැකකරු හෝ චූදිතයා නියෝජනය කරනු ලබන නීතිඥවරයකුට එම අවස්ථාවේ දී පැමිණීමට අවසර දෙනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 241 වන වගන්තිය සංශෝධනය කිරීම

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 241 වන වගන්තිය පහත දැක්වෙන පරිද මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ "අධිචෝදනා පත්‍රය ඔහුට භාරදීමට නොහැකි වී ඇති බවට" යන වචන වෙනුවට "අධිචෝදනා පත්‍රය ඔහුට භාරදීමට නොහැකි වී ඇති බවට; හෝ " යන වචන ආදේශ කිරීමෙන්;

(2) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:-

"(ඇ) 241අ වන වගන්තියේ විධිවිධාන සලකා බලමින් එවැනි තැනැත්තකුට අධිකරණයේ පෞද්ගලිකව ම පෙනී සිටින ලෙස නියම කිරීම අත්හැරිය යුතු බවට,".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 241 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 241අ වන වගන්තිය ලෙස බලාත්මක විය යුතු යඃ-

ප්‍රධාන ප්‍රඥප්තියට 241අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම

"විශේෂ අවස්ථානුගත කරුණු යටතේ චූදිතයාට පෞද්ගලිකවම පෙනී සිටින ලෙස නියම කිරීම අත්හැරිය හැකි බව

241අ. (1) ජූරි සභාවක් මගින් හෝ ජූරි සභාවක් නොමැතිව මහාධිකරණයේ නඩු විභාගයක් ආරම්භ කිරීමට නියමිතව ඇත්තේ හෝ ආරම්භ කරනු ලැබ ඇත්තේ කවර චූදිතයකු සම්බන්ධයෙන් ද, එම චූදිතයාට අධිකරණයේ පෞද්ගලිකව ම පෙනී සිටින ලෙස නියම කිරීම අදාළ අධිකරණ කලාපයේ මහාධිකරණයේ සැසි වාරයන්හි මූලාසනාරූඪ මහාධිකරණ විනිශ්චයකාරවරයා විසින් (4) වන උපවගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගෙන, අත් හරිනු ලැබිය හැකි ය.

(2) (4) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති හේතු එකක් හෝ වැඩි ප්‍රමාණයක් මත, යම් චූදිතයකු අධිකරණයේ පෞද්ගලිකව ම පෙනී සිටීමට නියම කිරීම අත්හරිනු ලැබිය හැකි බවට විනිශ්චයකාරවරයා සෑහීමකට පත්වන්නේ නම්, (3) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති අදාළ තැනැත්තා විසින් සිදු කරනු ලබන ඉල්ලීමක් මත, එම චූදිතයාට පෞද්ගලිකව ම පෙනී සිටීමට නියම කිරීම එසේ අත්හරිනු ලැබිය හැකි ය.

(3) චූදිතයකු සම්බන්ධයෙන්, (2) වන උපවගන්තිය යටතේ වන යම් ඉල්ලීමක් -

(අ) නීතිපතිවරයා විසින්;

(ආ) අවස්ථාවෝචිත පරිදි, චූදිතයා විසින් ම හෝ ඔහුගේ නීතිඥවරයා විසින්; හෝ

(ඇ) චූදිතයා රඳවා ඇති බන්ධනාගාරයේ බන්ධනාගාර අධිකාරිවරයා විසින්,

කරනු ලැබිය යුතු ය.

(4) විනිශ්චයකාරවරයා විසින්, (1) වන උපවගන්තිය යටතේ චූදිතයාට පෞද්ගලිකව ම පෙනී සිටින ලෙස නියම කිරීම අත්හැරීම, පහත දැක්වෙන හේතු මත සිදු කරනු ලැබිය හැකි යඃ-

(අ) චූදිතයාගේ ජීවිතයට තර්ජනයක් හෝ බරපතල හානියක් පිළිබඳ සැකයක් පවතින අවස්ථාවක දී;

(ආ) චූදිතයා විසින් සිදු කරන ලදැයි කියනු ලබන වරදට මහජනතාව දක්වන ප්‍රතික්‍රියාව මගින් සාමය කඩවීමක් සිදුවීමට ඉඩ ඇති අවස්ථාවක දී;

(ඇ) චූදිතයා රඳවා තබා ගැනීමෙන් මිදී පලායාමට හෝ ස්වේච්ඡාවෙන් නොවන ආකාරයට රඳවා තබා ගැනීමෙන් ඉවත් කරනු ලැබීමට ඉඩ ඇති අවස්ථාවක දී;

(ඈ) චූදිතයා අධිකරණයේ නඩු කටයුතුවලට බාධා කිරීමට ඉඩ ඇති අවස්ථාවක දී;

(ඉ) ජීවිතයට අන්තරායදායක වන යම් බෝවන හෝ සංස්පර්ශක රෝගයක් පැතිරීම වැළැක්වීම පිණිස චූදිතයා යම් ලිඛිත නීතියක් යටතේ නිරෝධායන තත්ත්වයකට ලක් කරනු ලැබ ඇති අවස්ථාවක දී; හෝ

(ඊ) තත්කාලයේ පවතින යම් වසංගත රෝග තත්ත්වයක් හෝ වෙනත් ඒ හා සමාන තත්ත්වයක් හේතුවෙන් චූදිතයා පෞද්ගලිකව ම පෙනී සිටීම මගින් මහජනතාවගේ ආරක්ෂාවට සහ සෞඛ්‍යයට තර්ජනයක් ඇතිවීමට ඉඩ ඇති අවස්ථාවක දී:

එසේ වුව ද, (4) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති හේතුවක පැවැත්ම නතර වී ඇති බව විනිශ්චයකාරවරයාගේ මතය වන අවස්ථාවක, ඔහු විසින් චූදිතයාට අධිකරණයේ පෞද්ගලිකව ම පෙනී සිටිය යුතු යැයි විධාන කළ හැකි අතර, ඔහුගේ පෙනී සිටීම මෙහි මින් පෙර විධිවිධාන සලස්වා ඇති ආකාරයෙන් බලාත්මක කරනු ලැබිය යුතු ය.

(5) මහාධිකරණ විනිශ්චයකාරවරයා විසින්, (1) වන උපවගන්තිය යටතේ චූදිතයකුට අධිකරණයේ පෞද්ගලිකව ම පෙනී සිටීමට නියම කිරීම අත්හරින අවස්ථාවක දී, ඒ සඳහා වන හේතු ලිඛිතව වාර්තා කරනු ලැබිය යුතු අතර, එම චූදිතයාට-

(අ) නීතිඥවරයකු මගින් අධිකරණයේ දී තමා නියෝජනය කරනු ලැබීමට අයිතිය තිබිය යුතු ය; සහ

(ආ) සමකාලීන හෝ ආසන්න සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධකයක් හරහා ඔහුගේ නියෝජනය සිදු කිරීමට සහ ඒ චූදිතයා විසින් හෝ ඔහු වෙනුවෙන් හෝ ඔහු සම්බන්ධයෙන් පවරනු ලැබ ඇති නඩු කටයුතු එවැනි සම්බන්ධකයක් මගින් නිරීක්ෂණය කිරීමට අවසර දෙනු ලැබිය යුතු ය.

(6) (අ) මහාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින්, (5) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව චූදිතයාට ඔහුගේ නියෝජනය සිදු කිරීම සඳහා සහ නඩු කටයුතු නිරීක්ෂණය කිරීම සඳහා පහසුකම් සැලසීමට අධිකරණය තුළ අවශ්‍ය කටයුතු පිළියෙළ කරනු ලැබිය යුතු ය.

(ආ) චූදිතයා රඳවා තබා ඇති බන්ධනාගාරයේ අධිකාරිවරයා හෝ එම චූදිතයා රඳවා තබා ඇති ස්ථානය භාර නිලධරයා විසින්, මහාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විමසා, (අ) ඡේදයේ සඳහන් පරිදි එකී රඳවා තබන චූදිතයාට ඔහුගේ නියෝජනය සිදු කිරීම සඳහා සහ අධිකරණයේ නඩු කටයුතු නිරීක්ෂණය කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සලස්වනු ලැබිය යුතු ය.

(ඇ) මේ උපවගන්තියේ කාර්යය සඳහා "රඳවා තබා ඇති ස්ථානය" යන්නෙන් යම් ලිඛිත නීතියක අර්ථානුකූලව යම් රඳවා තැබීමේ පහසුකමක් අදහස් වන අතර, (222 වන අධිකාරය වූ) නිරෝධායන සහ

රෝග වැළැක්වීමේ ආඥාපනතේ අර්ථානුකූලව යම් නිරෝධායන මධ්‍යස්ථානයක් සහ 2007 අංක 54 දරන ඖෂධවලට ඇබ්බැහි තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්ථාපනය) පිළිබඳ පනතේ අර්ථානුකූලව යම් ප්‍රතිකාර හා පුනරුත්ථාන මධ්‍යස්ථානයක් ද ඊට ඇතුළත් වේ.

(7) එවැනි චූදිතයකු රඳවා තබා ඇති ස්ථානය, එම චූදිතයාට අධිකරණයේ පෞද්ගලිකව ම පෙනී සිටීමට නියම කිරීම අත්හරින ලද විනිශ්චයකාරවරයාගේ අධිකරණ කොට්ඨාසය තුළ පිහිටන්නා වූ අවස්ථාවක දී, නඩුව කැඳවීමෙන් පසු පැය හතළිස් අටක් ගතවීමට පෙර එම විනිශ්චයකාරවරයා විසින් එම රඳවා තබා ඇති ස්ථානය බැලීමට යා යුතු අතර, එසේ රඳවා තබන චූදිතයාගේ යහසාධනය පිළිබඳ සොයා බැලිය යුතු ය.

(8) චූදිතයා රඳවා තබා ඇති ස්ථානය, එම චූදිතයාට අධිකරණයේ පෞද්ගලිකව ම පෙනී සිටීමට නියම කිරීම අත්හරින ලද විනිශ්චයකාරවරයාගේ අධිකරණ කොට්ඨාසයෙන් පිටත පිහිටන්නා වූ අවස්ථාවක දී, (7) වන උපවගන්තියේ සඳහන් කර ඇති කාර්යය සඳහා චූදිතයා රඳවා තබා ඇති ස්ථානය බැලීමට යන ලෙස අදාළ අධිකරණ කොට්ඨාසය විෂයයෙහි අධිකරණ බලය ඇති මහාධිකරණ විනිශ්චයකාරවරයාට නියමිත ආකෘති පත්‍රය මගින් වහාම දැනුම් දීම එම මහාධිකරණ විනිශ්චයකාරවරයාගේ කාර්යය විය යුතු ය.

(9) චූදිතයා රඳවා තබා ඇති ස්ථානය පිහිටා ඇත්තේ කවර විනිශ්චයකාරවරයකුට අයත් අධිකරණ කොට්ඨාසය තුළ ද, එම විනිශ්චයකාරවරයාට රඳවා තබා ඇති ස්ථානය බැලීම සඳහා යාමට හැකියාවක් නොමැති අවස්ථාවක දී, (7) වන උපවගන්තියේ සඳහන් කාර්යය සඳහා චූදිතයා රඳවා තබා ඇති ස්ථානය බැලීමට යන ලෙස නියමිත ආකෘති පත්‍රය මගින් වෙනත් යම් මහාධිකරණ විනිශ්චයකාරවරයකුට වහාම දැනුම් දීම එම විනිශ්චයකාරවරයාගේ කාර්යය විය යුතු ය.

(10) (8) වන හෝ (9) වන උපවගන්තිය යටතේ දැනුම් දීමක් කරනු ලැබුවේ යම් මහාධිකරණ විනිශ්චයකාරවරයකුට ද, ඒ විනිශ්චයකාරවරයා විසින් එම චූදිතයා රඳවා තබා ඇති ස්ථානය බැලීමට යන ලෙස ඉල්ලා සිටින ආකෘති පත්‍රය ඔහුට ලැබීමෙන් පැය හතළිස් අටක් ගතවීමට පෙර එම ස්ථානය බැලීමට යා යුතු අතර, එසේ බැලීමට යාමෙන් සතියක් ඇතුළත චූදිතයාට පෞද්ගලිකව ම පෙනී සිටීමට නියම කිරීම අත්හරින ලද විනිශ්චයකාරවරයා වෙත එසේ බැලීමට යාම පිළිබඳව, තත් කාර්යය සඳහා නියමිත ආකෘති පත්‍රයෙන් ලිඛිතව වාර්තා කරනු ලැබිය යුතු ය.

(11) එසේ රඳවා තබා සිටින එවැනි යම් චූදිතයකු (7) වන, (8) වන හෝ (9) වන උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව බන්ධනාගාරයට පැමිණෙන විනිශ්චයකාරවරයකු වෙත ඉදිරිපත් කිරීම සහ එම මහාධිකරණ විනිශ්චයකාරවරයා විසින් නියම කරනු ලබන පහසුකම් සැලැස්වීම බන්ධනාගාර අධිකාරිවරයාගේ කාර්යය විය යුතු ය.

(12) යම් විනිශ්චයකාරවරයකු විසින්, (7) වන, (8) වන හෝ (9) වන උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව යම් චූදිතයකුගේ යහසාධනය පිළිබඳ සොයා බැලීමට යම් බන්ධනාගාරයක් වෙත යන අවස්ථාවක දී, එම චූදිතයා නියෝජනය කරනු ලබන නීතිඥවරයකුට එම අවස්ථාවේ දී පැමිණීමට අවසර දෙනු ලැබිය යුතු ය.”.

**5.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව